64752



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**21 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II**
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය** - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** බොහෝ අය උත්සාහ කරනුයේ **මඩිය තර කර ගැනීමට** ය.
(1) අන්‍යයාගේ දේ පැහැර ගැනීමට
(2) තමන්ට නියමිත ප්‍රතිලාභ වැඩි කර ගැනීමට
(3) නොනිසි ලෙස ලාභ ලබා ගැනීමට
(4) තම ධනය ස්ථාවර කර ගැනීමට

**2.** තම හාම්පුතාට **යකා වැහී** ඇතැයි සිතූ සේවකයෝ නිහඬ වූහ.
(1) යකකු ආවේශ වීම
(2) වෛරයෙන් පළි ගැනීම
(3) කෝපාවිෂ්ට ව බැණ වැදීම
(4) තදින් කෝප වීම

**3.** උමතුවෙන් පෙළුණු ඔහු **ඉබාගාතේ** ගියේ ය.
(1) අරමුණක් නැති ව ගමන් කළේ ය.
(2) ඇත-මෑත ගමන් කළේ ය.
(3) අරමුණක් ඇති ව ගමන් කළේ ය.
(4) උම්මත්තකයකු සේ ගමන් කළේ ය.

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** රටෙහි වර්තමාන ආර්ථික තත්ත්වය විධිමත් ව .............................. කර ගත යුතු ය.
(1) නවීකරණය (2) කළමනාකරණය (3) නිරාකරණය (4) වර්ගීකරණය

**5.** සැමියාගේ වියෝව ඇයට බෙහෙවින් ම ......................... සිතුවිල්ලක් විය.
(1) ප්‍රයෝගකාරී (2) ආවේගකාරී (3) විනාශකාරී (4) වේදනාකාරී

**6.** දේශනය අවසානයෙහි කථිකයා සියලු කරුණු ................................ කොට දැක්වී ය.
(1) සම්පිණ්ඩනය (2) සම්භාෂණය (3) සම්පාදනය (4) සම්මිශ්‍රණය

[දෙවැනි පිටුව බලන්න.

**7.** සෑම පදයක ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) කලාගුරු, ගුරුමුෂ්ටි, පරමාණු, පිළිසකර
(2) ග්‍රීෂ්ම, චුම්භක, පිළියෙල, ප්‍රතිනිර්මාන
(3) බිහිසුනු, බැළලි, මයිලණු, මෘදුකාංග
(4) බුමුතුරුණු, මධ්‍යකාලීණ, මුඛ්‍යාර්ත, රළුපරළු

**8.** දේශය, රූකඩ, තාරාවා, නෞකාව යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කොම්බුව හා ගයනුකිත්ත, දිගු පාපිල්ල, ඇලපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය
(2) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, ඇලපිල්ල, දිගු පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත
(3) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දිගු පාපිල්ල, ඇලපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත
(4) කොම්බුව හා ගයනුකිත්ත, දිගු පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, ඇලපිල්ල

**9.** 'මිතුරා' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) ඕෂ්ඨජ, තාලුජ හා දන්තජ ය.
(2) කණ්ඨජ, ඕෂ්ඨජ හා දන්තජ ය.
(3) දන්තජ, තාලුජ හා මූර්ධජ ය.
(4) ඕෂ්ඨජ, දන්තජ හා මූර්ධජ ය.

**10.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) කාන්තාරය, සෙවණැල්ල, විරෝධය, පණිවුඩය
(2) කණ්ඩායම, කලියුගය, පෝෂණය, මර්දනය
(3) ප්‍රාචීන, බහුශ්‍රැත, බාලදක්ෂ, නටබුන්
(4) ක්‍රියාවලිය, බාදනය, සන්නිවේදනය, ප්‍රතිපාදනය

**11.** අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) නිවේදකයකු, පාලකයෙක්, ශ්‍රමණයෙක්, ගුරුවරයකු
(2) ගිරවුන්, ආගන්තුකයෙක්, සෙබළකු, ධනපතීන්
(3) දෙවියන්, ඇදුරකු, අප, නිළියක
(4) කපුටකු, දියණියන්, විවේචකයෙක්, ගායකයකු

**12.** 'අතරමං වුණු ළමයි දින දෙකකට පසු වනයෙන් එළියට පැමිණියහ.' යන වාක්‍යයෙහි '**වනයෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) අවධි (2) කරණ (3) ආධාර (4) කර්ම

**13.** 'සුනිමල' යන්න අයත් වන සමාසය කුමක් ද?
(1) විශේෂණ (2) විභක්ති (3) අන්‍යාර්ථ (4) අව්‍යය

**14.** 'අලංකාර + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) අලංකාරික (2) අලංකාරයික (3) ආලංකාරික (4) ආලංකරික

**15.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) උපසර්ග - දුර්ජන, දුර්මුඛ, දුර්ගන්ධ, දුරාචාර
(2) මිශ්‍ර ක්‍රියා - කමින්, නමින්, යමින්, දෙමින්
(3) තද්ධිත - ධනවන්ත, බලවන්ත, කුලවන්ත, ගුණවන්ත
(4) සන්ධි - කර්මානුරූප, ධර්මානුකූල, ස්වර්ණාභරණ, දේවාරූඪ

**16.** **ප්‍රයෝජ්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) රජතුමා වැවක් සාදවයි.
(2) අම්මා දරුවා නළවයි.
(3) නිලධාරියා ලියුමක් යවයි.
(4) ඔහු ආරාධිත අමුත්තාට අසුනක් පනවයි.

● අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

**17.** **දක්ෂිණාවෘත ශංඛය** වනාහි මංගල සම්මත වස්තුවකි.
(1) දකුණු පස බලා සිටින හක්ගෙඩිය
(2) දකුණු පැත්තට කරකැවුණු හක්ගෙඩිය
(3) දකුණු අතට ගන්නා හක්ගෙඩිය
(4) දකුණු ප්‍රදේශයෙන් හමු වූ හක්ගෙඩිය

**18.** **පරෝපකාරය** වනාහි උතුම් ගුණාංගයකි.
(1) සියලු දෙනාට උපකාර කිරීම
(2) අනෙක් තැනැත්තන් උපකාර කිරීම
(3) විදේශිකයන්ට උපකාර කිරීම
(4) අන්‍යයන්ට උපකාර කිරීම

[තුන්වැනි පිටුව බලන්න.

064752



**19.** සමහරු **අදෘශ්‍යමාන** බලවේග පසු පස හඹා යති.

(1) ඇසින් දකින (2) ඇසට නොපෙනෙන
(3) ඇසට පෙනෙන (4) දැකීමට අපහසු

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1) ගල්, ගඩොල්, වැලි, සිමෙන්ති
(2) පැදුර, ඇඳ, කොට්ටය, ඇතිරිල්ල
(3) පිඟාන, කෝප්පය, හැන්ද, ගෑරුප්පුව
(4) නවකතාව, කෙටිකතාව, සාකච්ඡාව, චිත්‍රය

**21.** එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | කුසුම - පුෂ්පය, | ඵල - ගෙඩි, | රථය - රිය, | රාත්‍රිය - රෑ |
| (2) | ශෛල - සෙල්, | වර්ෂා - වැස්ස, | කකුල - දණහිස, | ලෝකය - ජගත් |
| (3) | වතුර - පැන්, | වනිතා - මාතා, | තාත්තා - පියා, | මාළු - මත්ස්‍ය |
| (4) | යහළු - යෙහෙළි, | වසර - අවුරුද්ද, | සෙනසුරාදා - ශනිදා, | කෝච්චිය - දුම්රිය |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) බිරිඳ - අඹුව, පතිනිය, බිරිය, ස්වාමි දියණිය
(2) ග්‍රන්ථය - පොත, පුස්තකය, කාව්‍යය, ගත
(3) දෙවඟන - සුරාංගනා, දිව්‍යාංගනා, සුරඹ, සුරඟන
(4) භික්ෂුව - මහණ, ශ්‍රමණ, හාමුදුරුවෝ, ස්වාමීන් වහන්සේ

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) දුක - සතුට (2) අභ්‍යන්තර - බාහිර
(3) පදවි - තානාන්තර (4) ඉහළ - පහළ

**24.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'පිනැති' යනු ස්වර සන්ධියට අයත් පදයකි.
(2) 'අක්ෂර' යනු ස්වර පමණක් හැඳින්වීම සඳහා යොදන නාමයකි.
(3) 'වැටුණේ ය' යන්න අතීත කාල, ඒකවචන ක්‍රියා පදයකි.
(4) 'රජතමය' යන්නෙන් 'රිදියෙන් කරන ලද' යන අර්ථය ලැබේ.

**25.** පහත දක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලනික ව්‍යූහය විධිමත් ව පවත්වාගෙන යාම පාලකයාගේ යුතුකම ය.
(2) අසරණ වීථි සුනඛයන්ගේ ආරක්ෂාව ද රාජ්‍ය නොවන සංවිධාන මැදිහත් විය යුතු ය.
(3) නීති විරෝධී මද්‍යපාන නිෂ්පාදනය, ප්‍රවර්ධනයට හා ප්‍රවාහනය තහනම් කරමු.
(4) අධ්‍යාපනය නංවාලීමෙන් විෂය නිර්දේශ සංශෝධනය විධිමත් කළ හැකි ය.

● අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** අවශ්‍යතාවේ ස්වරූපය අනුව තම මතය වෙනස් කිරීම

(1) හක්කේ බුදුරැස් බොක්කෙ දඩමස් කීවා ලු.
(2) උලත් එකයි පිලත් එකයි කීවා ලු.
(3) ඉබ්බා වතුරට දැම්මා ම ඇන්නැවේ කීවා ලු.
(4) කන්න ඕන උණා ම කබරගොයත් තලගොයා වෙනවා ලු.

**27.** අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම

(1) කටින් බතල කොළ හිටවනවා වගේ.
(2) කබලෙන් ලිපට වැටුණා වගේ.
(3) අතු කඩා මොර කන්නා වගේ.
(4) ගලෙන් පට්ටයක් ගන්නවා වගේ.

**28.** පූර්වරූප සන්ධියට හා පරරූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ගෙත්තම්, ගොක්කොළ (2) හද්දවස, ගොක්කොළ
(3) ගොක්කොළ, ගෙත්තම් (4) හද්දවස, ගෙත්තම්

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) අඥානයෙක් සේ වැඩ නො කරන්න.
(2) දද පෙළ මඳ සුළඟට සෙලවුණෝ ය.
(3) සංචාරක කුරුල්ලන් ලංකාවට පැමිණ ඇත.
(4) ශිෂ්‍යයෝ ද ශිෂ්‍යාවෝ ද මම ද රැස්වීමට සහභාගි වුණෙමි.

**30.** (1) ධනවතා හෝ බලවතා හෝ ගුණවතා තුන් කොන් සටන ජය ගත්තෝ ය.
(2) ඥානවන්තයෝ ශාස්ත්‍රවන්තයන් වෙති.
(3) රිය අනතුරු වැළැක්වීමට පොලිස් නිලධාරීන් වග බලා ගනිති.
(4) නායකයන් රට ගොඩ නඟති'යි වර්තමාන තරුණ පිරිස සිතති.

**31.** ● සමහරු රට රැකියා ලබා ගැනීම ............................ අනාරක්ෂිත මුහුදු ගමන්වල යෙදෙති.
● අප මේ රට සංවර්ධනය කළ යුත්තේ අනාගත දරුවන් ............................ ය.
● පුතණුවනි, අභිමානවත් පුරවැසියකු ............................ ජීවත් වන්න.
● ඔහු දන්ත වෛද්‍යවරයකු ............................ වැඩ කළේ ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) පිණිස, වෙනුවෙන්, මෙන්, ළඟ (2) පිණිස, ළඟ, මෙන්, වෙනුවෙන්
(3) වෙනුවෙන්, ළඟ, මෙන්, පිණිස (4) වෙනුවෙන්, මෙන්, පිණිස, ළඟ

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"නිච්චියට ම කියන්න ඇහැකි ය?"

(1) නිශ්චිත වශයෙන් කීමට නොහැකි ද?
(2) නිශ්චිත ව ප්‍රකාශ කිරීම දුෂ්කර ද?
(3) නිශ්චිත වශයෙන් ම කීමට හැකි ද?
(4) නිශ්චිත ව ම කීම යෝග්‍ය ද?

**33.** කතාබහෙන් සිනාසෙමින්
**ජීවිතයේ ගිරිදුර්ගය**
නගින
සොඳුරු ගැහැනිය ඔබ

ඉහත පද්‍ය පාඨයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස

(1) උපමාවකි. (2) අතිශයෝක්තියකි. (3) රූපකයකි. (4) ස්වභාවෝක්තියකි.

**34.** 'සිනා කුමරි' කාව්‍ය නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(1) මහගම සේකර (2) චන්ද්‍රරත්න මානවසිංහ
(3) ජී. බී. සේනානායක (4) මොනිකා රුවන්පතිරණ

**35.** අලගියවන්න මුකවෙටිතුමා විසින් රචිත කෘතියක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) සිරිත් මල්දම (2) සැවුල් සන්දේශය
(3) කුස ජාතක කාව්‍යය (4) දහම් සොඬ දා කව

**36.** පහත සඳහන් කවියෙහි තුන්වන පදය තෝරන්න.

ඔබහට අත පොවනට උන්-මුන්හට ඉඩ නො තබමු ලංකා
අව හොත් මෙහි උන් ලුහුබඳවා ගොළු මුහුද ගෙවමු ලංකා
.......................................................................
ඔබ වෙනුවෙන් එන වෙඩි සැර මල් පෙති සේ සලකමු ලංකා

(1) හෙළ මුතු මිණි වැල් එකට දමා ලා ඔබ සරසමු ලංකා
(2) ගොඩ දිය අහසේ හැම තැනැ ඔබගේ නම කියවමු ලංකා
(3) ගස් වැල්වලැ මල් එකට ගොතා ලා ඔබ පලඳමු ලංකා
(4) මුහුදින් අඟලක් ඔබ වැවෙතොත් එහි පනිමු පනිමු ලංකා

**37.** 'ආකස්මික ව' හා 'ප්‍රහර්ෂය' යන පදවල අදහස **නිවැරදි ව** අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) අධික සන්තෝෂය, අනුමාන සිතුවිල්ල
(2) හේතුවක් නැති ව, ඉවසීමේ ගුණය
(3) අධික සන්තෝෂය, ඉවසීමේ ගුණය
(4) හේතුවක් නැති ව, අධික සන්තෝෂය

**38.** ධීවර භාෂාවේ 'පන්න කරනවා' යනු

(1) දැල් ඇදීම ය. (2) මසුන් මැරීම ය.
(3) මාළු වෙළෙඳාම ය. (4) ඔරුව දියත් කිරීම ය.

**39.** "බත් උපදනා ලෙස් මා අතින් අසව. සී සෑම නම් සුළං බදනා සේ ඉතා උගහට දෙයෙක. නඟුලෙක වියදණ්ඩෙක පිටවකෙක බඩවකෙක නිමුනෙක කෙවිල්ලෙක අවකැටෙක සීවැලෙක පෙරගිලියෙක පසුගිලියෙක.. කැවිටෙක ගොන්ගෙයෙක ගොවියෙකැයි යන මේ අටළොස් දෙනාගේ එක් වීමෙන් යන්නා වූ ගමන සී සෑම් නම් වෙයි."
මේ පාඨය අන්තර්ගත වන කෘතිය කුමක් ද?

(1) පූජාවලිය (2) බුත්සරණ (3) රාජාවලිය (4) අමාවතුර

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම් පාඨකයාට වින්දනයක් ඇති වන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය.

(1) තම අත්දැකීම් පාඨකයාට වඩාත් සමීප වන ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට හැකි වන්නේ නිර්මාණශීලී සාහිත්‍යකරුවකුට පමණි.
(2) අත්දැකීම් තෝරා ගැනීම හා ඒවා පාඨකයාට ඉදිරිපත් කරන ආකාරය අනුව සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය පිළිබිඹු කෙරෙයි.
(3) අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීමට නොහැකි වන අවස්ථාවල දී සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි නො වෙයි.
(4) සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළිවන්නේ උචිත අත්දැකීම් ඉදිරිපත් කරන ආකාරයත් පාඨකයා එය ග්‍රහණය කරගන්නා ආකාරයත් අනුව ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) සිංහල අක්ෂරමාලාවේ ඇතුළත්
(අ) අඝෝෂ ව්‍යඤ්ජන අක්ෂරයක් ලියා දක්වන්න.
(ආ) නාසික්‍ය අක්ෂරයක් ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද **දෙකක්** ලියන්න.
පුරාතන ගොවීන් විසින් වගා කෙරුණු දේශීය වී වර්ග භාවිතයෙන් බොහෝ රෝග සමනය වනු ඇතැයි සමහරු පවසති.

(iii) පහත සඳහන් පද විසන්ධි කරන්න.
(අ) පෙරපර (ආ) ළිංවතුර

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
කථනයේ දී මෙන් ම ලේඛණයේ දී ද වඩාත් රසවත් ව, අර්ථවත් ව අදහස් පළ කිරීම සඳහා සාම්ප්‍රධායික යෙදුම් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

(v) පහත සඳහන් අනුක්ත පදවල උක්ත රූප ලියා දක්වන්න.
(අ) ඔවුන් (ආ) ශිල්පියකු

(vi) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) ආගමන (ආ) අනර්ථවත්

(vii) පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරින් මුද්‍රිත** පද අයත් වන සන්ධි පද ප්‍රවර්ගය නම් කරන්න.
(අ) **බුත්සරණ** පොලොන්නරු අවධියට අයත් කෘතියකි.
(ආ) **පිළිතුරු** පත් ඇගයීම විධිමත් කරන ලෙස විදුහල්පතිතුමා දැනුම් දුන්නේ ය.

(viii) පහත සඳහන් වාක්‍යයේ අන්තර්ගත වන නිපාත පද **දෙකක්** ලියා දක්වන්න.
ශිෂ්‍යයන් මෙන් ම ගුරුවරු ද අධ්‍යයන කටයුතුවල යෙදෙති.

(ix) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) දරුවන් ගුරුවරු නමදිති.
(ආ) විනිසුරුවරයාත් නීතිඥවරුත් උසාවියට යයි.

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) චිත්‍රපට අධ්‍යක්ෂවරයා නළුවන් හසුරුවයි.
(ආ) ශිෂ්‍යයෝ චාරිකාවක් සංවිධානය කරති.

(ලකුණු 02 × 10 = 20 යි.)

[හත්වැනි පිටුව බලන්න.

**2.** පහත දැක්වෙන (අ). (ආ). (ඉ). (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** නිදහසේ මාධ්‍ය හැසිරවීමට අවකාශ ලැබීම යනු අසත්‍ය තොරතුරු සමාජගත කිරීමට ලැබෙන අවස්ථාවක් නොවේ. දෙස් විදෙස් තොරතුරු සමබරතාවකින් යුතු ව සමාජය වෙත සමීප කරවීම මාධ්‍යවල වගකීමයි. ඇතැම් ජනමාධ්‍ය මෙන් ම සමාජ මාධ්‍ය ද මේ කරුණු හරිහැටි වටහා ගෙන නොමැති බව වර්තමානයේ දක්නට ලැබේ. අසත්‍ය ප්‍රවෘත්ති මාධ්‍ය මගින් මුදා හැරීම මිනිස් සමාජය ප්‍රචණ්ඩත්වය කරා ගෙන යන දොරගුළු විවර කිරීමක් ද වනු ඇත. මේ නිසා මාධ්‍ය සදාචාරය පිළිබඳ නිසි වැටහීමකින් යුතු ව මාධ්‍යකරණයේ යෙදීමට මාධ්‍යකරුවන් වග බලා ගත යුතු ය.

**(ආ)** විදේශ විනිමය ඉපැයිය හැකි එක් ප්‍රධාන මාර්ගයක් ලෙස සංචාරක කර්මාන්තය මුල් තැනක් ගනියි. මේ බව වටහා ගත් බොහෝ රටවල් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. සුහදශීලී, සංග්‍රහශීලී සහ ආචාරශීලී ජනතාවක් වෙසෙන, ස්වභාව සෞන්දර්යයෙන් අනූන සුන්දර පාරාදීසයක් වන ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ද ප්‍රසිද්ධ ව ඇති බැවින් සංචාරක කර්මාන්තය තවදුරටත් නගා සිටුවීමට කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය.

**(ඉ)** දිවයිනේ බොහෝ ප්‍රදේශවල වී ගොවිතැන සහ එළවළු වගාව මහා පරිමාණයෙන් සිදු වන අයුරු දිස්වන නමුත් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන අවස්ථා මෙන් ම මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යන අවස්ථා ද දක්නට ලැබේ. අතරමැදියන් නිසා ගොවීන්ට නිසි මිලක් නොලැබෙන අතර ම පාරිභෝගිකයන්ට වැඩි මිලක් ගෙවා ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වී ඇත. මේ අතර එළවළු ප්‍රවාහනයේ දී සිදු වන අධික නාස්තිය ද සැලකිලිමත් විය යුතු කරුණකි. භෝග වගා කිරීමේ නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු අතර ම ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කිරීම කාලෝචිත වේ.

**(ඊ)** මිනිසාට මෙන් ම රටකට ද තම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා තාක්ෂණය අත්‍යවශ්‍ය සාධකයකි. තාක්ෂණය නිසි පරිදි හසුරුවාලීම මගින් විවිධ රටවල් තම අනාගත ඉලක්ක ජයගෙන ඇති ආකාරය පුදුම සහගත ය. ඉන් ප්‍රධාන අවස්ථාවක් ලෙස කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීම දැක්විය හැකි ය. මිනිස් මොළය වෙහෙසා කළ යුතු කාර්යයන් සඳහා ඉතා සුළු වේලාවක් තුළ නිශ්චිත විසඳුම් ලබා දීමට කෘත්‍රිම බුද්ධිය සමත් වී ඇත. නවීන තාක්ෂණය මිනිසාගෙන් ඔබ්බට ගමන් කරන ආකාරයක් දිස්වන අතර ම එය මිනිසා අබිබවා යන දිනය වැඩි ඈතක නොවන අයුරක් ද විද්‍යමාන වේ.

(ලකුණු 25 යි.)

**3.** පහත දැක්වෙන පාඨය වචන **60 - 70** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අහස, පොළොව, ජලය, සුළඟ හා ස්වාභාවික පරිසරය ද මිනිසාගේ පැවැත්මට බාධා ගෙන දෙමින් විපරීත තත්ත්වයට පත් ව ඇත්තේ ය. අනුමාන කළ නොහැකි බොහෝ ලෙඩ රෝග වැළඳීමටත් ස්වභාවධර්මය අකාරුණික ලෙසට මිනිසාට එරෙහි ව නැඟී සිටීමටත් පටන් ගෙන ඇති බවත් පෙනෙන්නට තිබේ. මෙම අකාරුණික තත්ත්වයට වගකිව යුත්තේ අන් කිසිවකු නොව මිනිසා ම ය. මිනිසාගේ දිවි පැවැත්මට හා ඉදිරි ගමනට ආධාර උපකාර කළ ස්වභාවධර්මයට මිනිසා අකාරුණික වීම මෙම ව්‍යසනවලට එක් හේතුවකි. අප අවට ඇති බොහෝ ස්වාභාවික මෙන් ම භෞතික වස්තූන් ද මිනිසා විසින් මිනිසාට එරෙහි ව නිපදවා ඇති බොහෝ විනාශකාරී දේ ද අද මිනිසාට විශාල ගැටලුවක් ඇති කර තිබේ. මෙම තත්ත්වය තවමත් අප තේරුම් ගෙන නොමැත. මේ නිසා වර්තමානයේ ජීවත් වන ජනතාවට නැවත වරක් අපසු හැරී බලන්නට සිදු වී ඇත. අනාගත ලෝකය වඩාත් යහපත් තැනක් බවට පත් කිරීමේ මෙහෙයුම දියත් කිරීම කඩිනමින් ආරම්භ කළ යුතු වන්නේ මේ වන විටත් සොබාදහම සහ අප ජීවත් වන අවට පරිසරය විශාල සොදා පාළුකර, විපතකට හා විනාශයකට පත් ව ඇති නිසා ය. සදාචාරාත්මක යයි ගැනෙන සියලු දේ පිරිහීමට ලක් ව ඇත්තේ ය. එමෙන් ම ශිෂ්ටාචාරය විසින් අපට උරුම කළ බොහෝ දේත් ස්වභාවයෙන් ම අපට ලැබුණු ලෙඩ රෝගවලින් වැළැකීමේ ශක්තියත් කායික-මානසික සුවතාවත් විනාශ වී ගොස් ය. මෙම තත්ත්වය ඉදිරියේ දී තව තවත් වර්ධනය වීමට ඇති ඉඩකඩ අතිවිශාල ය.

(ලකුණු 10 යි.)

[අටවැනි පිටුව බලන්න.

**4.** පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට **පිළිතුරු** සපයන්න.

වැව, මුළු ගම්වැසියන්ට පොදුවේ අයිති ව තිබුණ ද, එයින් ජලය ලැබූ පෙදෙස, ප්‍රමාණයත් අස්වැන්නත් අතින් එකිනෙකට වෙනස් වූ කොටස්වලට බෙදා තිබුණි. එහෙත්, ජලය අපතේ යෑම වළක්වනු සඳහා සී සෑමත් කුඹුරුවලට වතුර ඇරීමත් නියම පිළිවෙළකට කළ යුතු විය. කුඹුරු වගා කිරීම පිළිබඳ මේ ආදි කටයුතු පාලනය කිරීම පිණිස 'වෙල්කැමි' ආදි නම් ඇති නිලධාරීන් සිටි බව නවවැනි, දසවැනි සියවස්වලට අයත් සෙල්ලිපිවලින් පෙනෙයි. සී සෑම් ආදි වැඩවල දී මේ නීතිරීති අනුගමනය නොකළ ගොවීන්ට දඩ ගසන ලදි. තමන්ගේ කුඹුරු කොටස් නියම කාලයේ දී වගා කිරීම අතපසු කළ ගොවීන්ට ද දඩ ගසන ලදි. නියම වාරයේ දී ජලය සැපයීම සහ සී සෑම පිළිබඳ ප්‍රශ්න පමණක් නොව, ඒ ඒ කුඹුරුවල වැපිරිය යුතු වී වර්ගය කුමක් ද යන්න තීරණය කර ගැනීමට පවා ඒ ඒ ගොවියාට ඉඩ තිබුණේ නැත. තිසා වැවෙන් ජලය සපයනු ලබන, ඉසුරුමුණි වෙහෙරට අයත් කුඹුරුවල සිහිනැටි (හීනැටි) වැපිරිය යුතු බව ඒ වැවෙන් ජලය බෙදා හැරීම පිළිබඳ නීතිරීති ඇතුළත් කර IV මහින්ද රජු පිහිට වූ සෙල්ලිපියේ කියා තිබේ. හේන් ගොවිතැන් කරනු ලැබූ ඉඩම් ගැන සෙල්ලිපිවල සඳහන් වන කරුණුවලින් පෙනෙන්නේ දසවැනි සියවසේ දී ඒ ඒ ධාන්‍ය වර්ග වැපිරිය යුතු ඉඩම් යායවල් මේ මේවා යයි රජයෙන් නියම කර තිබුණු බවයි.

නවවැනි සහ දසවැනි සියවස්වල දී ගොවිතැන් කරන ලද්දේ එක්තරා සැලැස්මක් ඇති ව බව මෙයින් පෙනෙයි. රටවැසියන්ගේ ජීවිතය සඳහා අවශ්‍ය ද්‍රව්‍යවලින් සමහර ඒවා හිඟ වීමටත්, සමහර ඒවා වැඩියෙන් නිෂ්පාදනය කිරීමටත් ඉඩ නො තබා අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය කිරීම එහි අදහස විය. සියලු රටවැසියන්ගේ යහපත සඳහා උවමනා තරමට ගොවියාගේ නිදහස මෙපරිද්දෙන් සීමාකර තිබුණේ ය. ඉඩම්වල වගා කරන ලද භෝග ජාති අතින් හෝ සාමාන්‍යයෙන් කෘෂි අර්ථක්‍රමය අතින් හෝ මේ යුගයේ තත්ත්වයත්, මීට පෙර යුගයේ තත්ත්වයත් අතර වැදගත් වෙනසක් නො වී ය. තමා විසින් නිපදවන ලද අස්වැන්නෙන් එක්තරා කොටසක් කිසියම් ආරාමයකට හෝ උසස් නිලධාරියෙකුට හෝ රාජවල්ලභයෙකුට හෝ ආරෝග්‍යශාලා ආදි පුණ්‍යායතනයකට හෝ ගෙවීමට සෑම ගොවියෙකුට ම පාහේ සිදු විය. තව ද අස්වැන්නෙන් නියමිත කොටසක් දියබද්ද වශයෙන් දීමට ද ගොවියාට සිදු විය. වත්තේ හෝ හේනේ වවන ලද ද්‍රව්‍යවලිනුත්, එහි දී ලබාගත් පස්ගෝරසවලිනුත් කිසියම් නියමිත කොටසක් ඉඩම් හිමියාට දීමට සිදු විය. එහෙත්, මේවා පිළිබඳ විස්තර දැන ගන්නට නැත. රටේ එක් ප්‍රදේශයක පිළිවෙළ වෙනත් ප්‍රදේශයක පිළිවෙළට වඩා වෙනස් වූ බව පෙනෙයි.

(i) ජලය අපතේ යෑම වැළැක්වීම සඳහා අනුගමනය කෙරුණු ක්‍රියාමාර්ග **දෙක** මොනවා ද?

(ii) ගොවීන් දඩ ගැසීමට ලක් වූයේ කිනම් කාරණා සම්බන්ධයෙන් ද?

(iii) ඉසුරුමුණි වෙහෙරට අයත් කුඹුරුවල වැපිරිය යුතු වී වර්ග පිළිබඳ ව සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?

(iv) නවවැනි හා දසවැනි සියවස්වල දී සැලැස්මක් ඇති ව ගොවිතැන් කටයුතු සිදු කිරීමෙන් අදහස් කරන ලද්දේ කුමක් ද?

(v) ගොවියාගෙන් ඉඩම් හිමියාට ලැබුණේ මොනවා ද?

(ලකුණු $02 \times 5 = 10$ යි.)

**5.**
- පනාතැන්න සහ බෝදාගම නගරය යා කරමින් ගඟ හරහා ඉදිකර ඇති මගී පාලම අබලන් තත්ත්වයක පැවතීම
- දැනට පාරු සේවයක් ආරම්භ කර ඇතත් එදිනෙදා විවිධ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට නගරයට යන්නන් සඳහා එය ප්‍රමාණවත් නොවීම
- ගමේ සිට නගරය දක්වා ඇති කිලෝමීටර තුනක් පමණ වූ මහාමාර්ගය ද අබලන් වී ඇති බැවින් බස්රථයක් ධාවනය නොවීම

ඉහත කරුණු යටතේ මගීන්ට අත්විඳීමට සිදු ව ඇති දුෂ්කරතා විස්තර කරමින් පාලම කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා නගර සභාවේ නගරාධිපති වෙත යැවීම සඳහා සුදුසු රාජකාරි ලිපියක් ලියන්න.
(ඔබ පනාතැන්න ග්‍රාමෝදය සමිතියේ ලේකම් අරුණ ජයමහ යැයි සිතන්න.)

**නැතහොත්**

අංක 360, නවනගරය, බෝදාගම පිහිටි, මුළුතැන්ගෙයි උපකරණ සහ විදුලි උපකරණ ආනයනය කර බෙදා හරින පෞද්ගලික සමාගමක් වන X - ලංකා ආයතනය සිය වෙළෙඳ ජාලය පුළුල් කිරීමේ අරමුණින් පාරිභෝගිකයන්ට සහන රාශියක් හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

- භාණ්ඩ මිල දී ගැනීමේ දී වාරික මගින් ගෙවීමේ පහසුකම්
- මිල දී ගන්නා භාණ්ඩවල වටිනාකම අනුව 5% - 15% දක්වා විශේෂ වට්ටම්
- තමාට අවශ්‍ය භාණ්ඩ නිවසට ම ගෙන්වා ගැනීමේ පහසුකම්
- භාණ්ඩ සඳහා වසර දෙකක වගකීමක්
- අලෙවියෙන් පසු සේවාව

මේ කරුණු ඇතුළත් කරමින් පුවත්පතක පළ කිරීමට සුදුසු ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න.

(ලකුණු 15 යි.)

* * *

64752



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය III | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் III | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature III | Two hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

(අ) මේ පද්‍යය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයට ද?
(ආ) මෙහි සඳහන් කර ඇති නිෂ්ඵල ක්‍රියාව කුමක් ද?

(ii) **ජාතිය රන් විමනක් වේ**
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙ ලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) කවියා පුතුට රැකගන්නට අවශ්‍ය යැයි යෝජනා කරන්නේ මොනවා ද?

(iii) "පෙරේතයො කෑම කන්නෙ නෑ. කෑමට දිෂ්ටිය හෙළනව. එහෙම දිෂ්ටිය හෙළපු කෑම කාපුවහම තමයි ලෙඩ වෙන්නෙ."

(අ) මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම කුමක් ද?
(ආ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් කාහට ද?

(iv) "අඬල වැඩක් නෑ ළමයා. මං දැන් හොඳට ම වයස මිනිහෙක්. මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ"

(අ) මෙහි ළමයා යනුවෙන් හැඳින් වූ අයගේ නම ලියන්න.
(ආ) මේ ප්‍රකාශය කරන තැනැත්තා වඩා හොඳින් ම දැන සිටි කාරණය කුමක් ද?

(v) නොදනිති හසරක් නුපුරුදු එ තිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත නරයෙකි ගත මුදු
ලොව දැක නැත අද වන තුරු කිසි කල

(අ) මෙහි **එ තිදෙන** යනුවෙන් හැඳින්වූ අය නම් කරන්න.
(ආ) 'කරදර' යන්නට සමානාර්ථ පදයක් පද්‍ය පාඨයෙන් උපුටා දක්වන්න.

(vi) "සෘද්ධිමත් කෙනකුන් ආකාශයෙන් ගොසින් වදුත් මුත් මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරි ය."

(අ) මේ ප්‍රකාශය ශ්‍රවණය කරනු ලැබූයේ කවරකු විසින් ද?
(ආ) මෙහි සඳහන් නුවර හැඳින්වූයේ කුමන නමකින් ද?

[දෙවැනි පිටුව බලන්න.

(vii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.

රි වි තැ වු ලේ පිපි කමලේ විල් ගැවැසී
ම ත කො වු ලේ තුරු වදලේ හඬන නිසී

(අ) ....................................................................

(ආ) ....................................................................

(viii) "මම පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳ ගනිම් මැ යැ. අසුන් ලුහුබැඳ ගනිම් මැ යැ. රථ ලුහුබැඳ ගනිම් මැ යැ. දිවෙන මුවන් ලුහුබැඳ ගනිම් මැ යැ."

(අ) මෙසේ සිතන ලද්දේ කවරකු විසින් ද?

(ආ) මෙසේ සිතන්නට හේතු වූ කරුණ කුමක් ද?

(ix) යොදා සවන් වෙණ නද රස සුලබව
නදා එකග සිත් වත නො ම සකොබව
සදා කුලය නොහැර ම එන අසුබව
එදා ගියේ රිළවුන් සන්සල බව

(අ) මේ පද්‍යය උපුටාගත් කෘතියේ රචකයා නම් කරන්න.

(ආ) රිළවුන්ගේ චංචලභාවය පහව ගියේ කුමක් නිසා ද?

(x) (අ) 'සද්ධර්මරත්නාවලිය' රචනා වී ඇත්තේ කුමන රජු දවස ද?

(ආ) 'සද්ධර්මරත්නාවලිය' රචනා කිරීම සඳහා පාදක කර ගෙන ඇති ග්‍රන්ථයේ නම කුමක් ද?

(ලකුණු 02 × 10 = 20 යි.)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **සු ර ර ද** සමන් සමගින් සුර'ගන එ වර
**පැහැ න ද** මදාරා පරසතු මල් පතර
කැර පු ද වඳින රැඳි මුනි සිරි පා තඹර
සකි ස ද පෙනේ සමනොළ ගල නැගෙන හිර

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) කවියා, සැළලිහිණියා අමතා කරන විස්තරය කෙටියෙන් ලියන්න.

(ii) "එක් දවසක් කඹයේ නටන එකකුගේ දුවක් හුණදඬු අගක දී නටන එකක් ශිල්ප බලයෙන් උඩ අහස සක්මනුත් කෙරෙයි; නටයි; ගීත් කියයි. එ දවස් උග්ගසේන නම් සිටුපුත් **යාළණු** කෙනකුන් හා සමග මැස්සක් මත්තෙහි සිට ආස සිට නටන ඒ විද්දත් දුවගේ **හාවභාව ලීලා** දැක වායොධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නො සිතා ඈ කෙරෙහි බලවත් වූ ප්‍රෙම ඇති ව 'ලදොත් ජීවත් වෙමී. නො ලදොත් මියෙමී' සිතා ගෙන නො කා නො බී හැඳට නැඟී ලා වැද හොත්තාහ."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම දක්වන්න.

(ආ) විද්දත් දුව කෙරෙහි බැඳුණු උග්ගසේන සිටුපුත් හැසුරුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iii) තුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තිදසින් දා
කුරිරු **ගිපින්දා**
කුඹු තල සින්දා
ලම් සේ **කෙසරින්දා**
මා පිය මිගිඳා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(ආ) ඉහත දැක්වෙන උද්ධෘතයේ අර්ථය සරල බසින් ලියන්න.

[තුන්වැනි පිටුව බලන්න.

(iv) "ඒ කේවට්ටාචාරි එක් දවසක් තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම **පුෂ්පදාමාවලම්බිත** නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් **ගර්භය** බලන්නාහු මහත් වූ සම්පත් දැක, "මේ මාගේ යසස කවුරුන් සන්තක දෝ හෝ' යි සිතන්නාහු 'අනෙක් කෙනෙකුන් සන්තක නො වෙයි; ..."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(ආ) මේ පාඨයේ අදහස සරල බසින් ලියන්න.

(v) දිමුතු යසස් වන් **කුසුම** **සරාගේ**
**නුමුතු** සුවඳ මල් පැලඳ සරාගේ
දකුතු රඟන සුරඟන රඟ ලාගේ
උමතු නො වෙ ද කෙලෙසක සිත කාගේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) දිව්‍යාංගනාවන් රංගනය සඳහා සැරසී සිටි ආකාරය කවියා විස්තර කර ඇත්තේ කෙසේ ද?

(ලකුණු 04 × 5 = 20 යි.)

3. උග්ගසේන සිටුපුත්ගේ තීරණය හමුවේ,
- ඔහුගේ මවුපියන්ගේ ක්‍රියාකලාපයත්
- විද්දත් දුවගේ පියාණන්ගේ ක්‍රියාකලාපයත්

අතර ඇති පරස්පරතාව කථා විකාශනයට මහත් පිටිවහලක් වී ඇති අයුරු 'සද්ධර්මරත්නාවලිය' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

- පරිසර වර්ණනයේ චමත්කාරයත්
- ශ්‍රද්ධා භක්තිය වඩවන වෙහෙර වැනුමත්

පාඨකයා ආකර්ෂණය කර ගැනීමට හේතු සාධක වී ඇති ආකාරය 'හංස සන්දේශය' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි.)

4.
- කාව්‍යෝක්ති නිර්මාණයේ අපූර්වත්වයත්
- වස්සාන සමයේ දී පරිසරයේ මැවෙන සුන්දරත්වයත්

කැටි වූ අපූර්ව කාව්‍ය නිර්මාණයක් ලෙස 'වස්සානය' පැදිපෙළ අගය කළ හැකි ය.
එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

- කැලෑ ජීවිතයේ කයෝරත්වයත්
- නූගත්කම නිසා අත් විඳින්නට සිදු වන පීඩාවත්

'බැද්දේගම' නවකතාව මගින් මනා ලෙස නිරූපණය කිරීමට කතුවරයා සමත් ව ඇත.
නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි.)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. සාවද්‍ය උපකල්පනයක පිහිටි ගුරුවරයකු තම ගෝලයකු අඳුරේ හෙළීම සඳහා ක්‍රියා කළ ආකාරය 'අමාවතුර' නිර්දිෂ්ට කොටස ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි.)

6. සොබා දහමේ විවිධ සංසිද්ධීන් විස්තර කිරීමේ දී උචිත කාව්‍යෝක්ති යොදා ගැනීම 'ගංගාවේ සංගීතය' පැදිපෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට පැදිපෙළ ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි.)

7. යහපත් ජීවිතයකට අවශ්‍ය මග පෙන්වීම් ලබා දීමට ජන කවියා උත්සුක වී ඇති අයුරු 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' පාඩම ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

***